# අපේ ගෙදරට පුංචි අමුත්තෙක්



කේ.එම්.ගඟුලි ශමීක්ෂණා කුලතුංග

# අපේ ගෙදරට පුංචි අමුත්තෙක්

කේ.එම්.ගගුලි ශමීක්ෂණා කුලතුංග

(කතෘ)

කතෘගේ වෙනත් කෘති : -අනුන්ගේ දේ ගන්න එපා

- Stupid me
- What a surprise!

මහාමායා බාලිකා විද්‍යාලය

5 ශ්‍රේණිය B

2025/02/08

ISBN : 978-624-208-676-7

මාගේ
දෙමවුපියන්ට,
සහෝදර
සහෝදරියන්ට,
ගුරුවරුන්ට
සහ මිතුරු
මිතුරියන්ට
ආදරයෙන්
පුදමි...

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

දවසක් මම හවස සෙල්ලම් කරලා එනකොට, අම්මා මට කිව්වා අම්මට පුංචි බබෙක් හම්බවෙන්න යන්නේ කියලා. මගේ ඇස් උඩ ගියා. මට හරිම සතුටුයි.



මම මට පුලුවන් හැම වේලාවෙම අම්මට උදවු කළා, ඒ වගේම කැව්වා. ඔහොම මාස 5ක් විතර ගියාට පස්සේ දවසක් රෑ මම ඇඳ ළඟට යනකොට, “චූටි දුව... ඉක්මණට මෙහෙට එන්නකෝ.....” අම්මා මට කතා කරා. මම දුවලා ගියා.



මම ගියාම අම්මා මගේ අත අරගෙන අම්මාගේ බඩ උඩින් තිබ්බා. පුංචි බබා බඩ ඇතුලේ ඉඳන් හොඳටම දඟලනවා. මට හරි හිනා. මම ප්‍රාර්ථනා කරනවා එයා ගොඩක් හුරතල් පුංචි මල්ලි කෙනෙක් වෙන්න කියලා.



මගේ පැතුම ඉටුවුණා. දොස්තර මාමා කිව්වා මල්ලී එළියට ආවම පරිස්සමින් බලා ගන්න කියලා. ඔහොම මාස දහයක් ගියාම අම්මා රෝහලට ගියා. මම උදේ ඉස්කෝලේ ගිහින් ගෙදර එනකොට අප්පච්චි කිව්වා “ඉක්මණට අක්කිත් එක්ක ඇඟ සෝදගෙන, බත් කාලා, එන්න. අපි මල්ලි බලන්න යමු.” කියලා.



මමයි, අක්කියි මල්ලි බලන්න අප්පච්චි එක්ක රෝහලට ගියා. අම්මා මල්ලිව මගේ අතට දුන්නා. “අනේ මල් පෙත්තක් වගේ සිනිඳුයි! පුංචිම පුංචි මල් කැකුලක්.” මට ඉබේටම කියවුනා.



ඊළඟ දවසේ මල්ලී ගෙදර ගෙනාවා. එයා හොඳටම බය වෙලා. අම්මා මල්ලිට කිරි දෙනකොට, මල්ලී හොරා වගේ නිදියනවා.



අපේ පුංචි මල්ලිව බලන්න නෑදැයොත් ආවා. නිකම් නෙමෙයි ආවේ අපේ මල්ලිට තෑගිත් අරගෙන.



අම්මගේ තුරුලේ පුංචි මල් කැකුල හෙමින් හෙමින් නිදියනකොට, බලන් ඉන්න ආසයි. තාම එයාට මාසයක්වත් නෑනේ. හරිම චූටියි. තාම තේරෙන්නෙත් නෑනේ.



එයා ටික ටික ලොකු වෙනකොට, ටික ටික දඟ වෙනවා. එයා දවසක් අම්මා නිදාගෙන ඉන්න කොට හෙමින් අම්මාගේ කොණ්ඩය කැවා. අම්මා මල්ලිට “ඔන්න නෝටි වැඩ කරොත් ගුටි දෙනවා!” කියලා කියන කොට, එයා හිනා වෙනවා.



මගේ මල්ලි දඟ වුණත් නැතත් මම එයාට හරිම ආදරෙයි. මම කවදාවත් එයාට නරකක් වෙන්න දෙන්නේ නෑ. දවසක එයා තමයි අපේ ගැළවුම් කාරයා කියලා අම්මා මට කිව්වා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්